# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1797/21 - 2013 පෙබරවාරි මස 15 වැනි සිකුරාදා - 2013.02.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී 5/2012

### ජාතික රාජ්‍ය සභාවේ 1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 10 සහ 25 වැනි වගන්තිය සමඟ කියවිය යුතු ඒ පනතේ 30 වැනි වගන්තිය යටතේ ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද නියෝගය.

කෙහෙලිය රඹුක්වැල්ල,
ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍ය.

2013 ජනවාරි මස 13 වැනි දින,
කොළඹ දී ය.

නියෝගය

1994 පෙබරවාරි මස 15 වැනි දින අංක 806/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අවසන්වරට සංශෝධිත 1973 ජූනි මස 12 වැනි දින අංක 63/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ 1973 පුවත්පත් මණ්ඩල (පොදු නියෝග) එහි 11 වැනි නියෝගය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"11(අ) අවස්ථාවෝචිත පරිදි පුවත්පතක අයිතිකරුගේ හෝ කර්තෘගේ හෝ නම ලියාපදිංචි කිරීම සඳහා හෝ එම ලියාපදිංචි කිරීම අළුත් කිරීම සඳහා හෝ ඉල්ලුම් කරන පුවත්පතක සෑම අයිතිකරුවකු හෝ කර්තෘවරයකු විසින්ම, ඒ සඳහා එම ඉල්ලුම් පත්‍රය සමඟ මෙහි පහත දැක්වෙන ගාස්තු ප්‍රමාණ අනුව, ගාස්තුවක් ඉදිරිපත් කළ යුතු ය :-

1. දිනපතා පුවත්පතක් සම්බන්ධ ලියාපදිංචි කිරීමක් හෝ ලියාපදිංචිය අළුත් කිරීමක් සඳහා රුපියල් පන්දහසක් (රු. 5,000)
2. සතිපතා පුවත්පතක් සම්බන්ධ ලියාපදිංචි කිරීමක් හෝ ලියාපදිංචිය අළුත් කිරීමක් සඳහා රුපියල් තුන්දහසක් (රු. 3,000)
3. වෙනත් යම් පුවත්පතක් සම්බන්ධ ලියාපදිංචි කිරීමක් හෝ ලියාපදිංචිය අළුත් කිරීමක් සඳහා රුපියල් දෙදහසක් (රු. 2,000)

(ආ) ලියාපදිංචිය අළුත් කිරීමක් සඳහා වූ ඉල්ලුම් පතක් යම් වර්ෂයක මාර්තු මස 31 වැනි දිනට පසුව ඉදිරිපත් කරන අවස්ථාවකදී අවස්ථාවෝචිත පරිදි අදාළ අයිතිකරු හෝ කර්තෘ විසින්, ප්‍රමාද ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් වශයෙන් එම වර්ෂයේ මාර්තු මස 31 වැනි දිනෙන් පසුව එම ප්‍රමාද වීම පවතින සෑම මාසයක් හෝ ඉන් යම් කොටසක් සඳහාම රුපියල් පන්සියය (රු. 500) බැගින් මුදලක් ගෙවිය යුතු ය".

03-226


1A - PG 001561 — 685 (2013/02)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත හැක.